

# “1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පොදුජන අයිතිය ආරක්ෂා කරයි”

ආර්. ප්‍රේමදාස

BKT0174
26/08/2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජාතික ළමා අධ්‍යාපන පදනම මගින් මුල්ලේරියාව නව නගරයෙහි අභිනවයෙන් ඉදිකරන ලද මූලස්ථානය සහ ආදර්ශ ළදරු පාසල විවෘත කිරීම නිමිත්තෙන් පැවති උත්සවය අමතා

1987 අගෝස්තු 8 වැනි දින

## ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

# ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා

විසින් පවත්වන ලද කථාව

අපි සියලුදෙනාම අද දවසේ ඉතා උසස් කාර්‍යයකටයි සහභාගී වෙන්නේ. මූලාසනාරූඪ අතිගරු පණ්ඩිත බද්දේගම ශ්‍රී විමලවංශාභිධාන අනුනායක මාහිමිපාණන් වහන්සේගේ දීප්තිමත් ශිෂ්‍ය රත්නයක් විසින් අපේ රටේ ළමා අධ්‍යාපනය සඳහා ආරම්භ කෙරෙන ඉතාමත් ම උසස් කාර්‍යයකට යි දැන් අපි අද සහභාගී වෙන්නේ. ශාස්ත්‍රවේදී ගරු බඳගිරියේ සෝමවංශ ස්වාමීන්වහන්සේ ජපන් රටට වැඩමකොට ජපන් භාෂාව ඉගෙනගෙන ජපන් බෞද්ධ පිරිසට බුද්ධ ධර්මයේ ආශ්වාදය ලබාදෙමින් ජපන් රටින් ඉගෙන ගන්න පුළුවන් ළමා අධ්‍යාපන ක්‍රමය ගැන විශේෂ අධ්‍යයනයක් කරල ආපසු අපේ රටට වැඩම කළා. ඒ අවස්ථාවේදී බඳගිරියේ සෝමවංශ ස්වාමීන්වහන්සෙ මාව හමුවුණා. තමන්වහන්සේ ආභාෂය ලබපු මේ ළදරු අධ්‍යාපන ක්‍රමය අපේ රටට ගැලපෙන හැටියට ක්‍රියාත්මක කරන්න උන්වහන්සේ තුළ විශේෂ උනන්දුවක් ඇතිවී තිබෙන බව මට පේනව. ඒ අනුව තමයි මේ වැඩපිළිවෙළ අද මේ තරම් ක්‍රමවත් අන්දමින් ආරම්භ කළේ. මම බොහොම ස්තුතිවන්ත වෙනව තමුන්නාන්සේලාගෙ මන්ත්‍රීතුමාට - දියා ඇමති වීරසිංහ මල්ලිමාරච්චි මහතාට මේ සඳහා මේ භූමි භාගය වෙන්කරන්න එකඟවීම ගැන. මට මතකයි, මේ ප්‍රදේශයේ මං සංචාරය කරන කොට මේ ඉඩ ප්‍රමාණය අපට දැකගන්න ලැබුණා. එහි නිවාස සංවර්ධන වැඩපිළිවෙළක් ආරම්භ කරන්න අපි එදා කල්පනා කළා. සෞඛ්‍ය අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කරල. ඒ වැඩපිළිවෙළ අපි නම නියම කරගත්තා.

බදගිරියේ සෝමවංශ ස්වාමීත්වහත්සේ මේ සඳහා සුදුසු භූමි භාගයක් ගැන සඳහන් කරන කොට මට එකවරම මතක් වුනේ මේ ප්‍රදේශය. ඒ නිසයි, තමුන්නාන්සේලාගෙ මන්ත්‍රීතුමාට – දිසා ඇමතිතුමාට මේ කාරණය පැවරුවේ. අද මට පෙනෙනව මේ තරම් ක්‍රමානුකූලව ගොඩනැගිලි සංකීර්ණයක් ඇති කරල මේ වැඩපිළිවෙළ ආරම්භ කරන උසස් ආකාරය. බදගිරියේ සෝමවංශ ස්වාමීත්වහන්සේට මේ පිළිබඳව විශේෂ ආභාෂයක් ලබා දුන්නෙ කවුද ? ජපානයේ මහාචාර්යවරයෙක්. එතුමා මේ වේදිකාවේ සිටිනව. මහාචාර්ය හිරෝෂි කුබෝතා මහතා. මහාචාර්ය හිරෝෂි කුබෝතා මහතා මේ වැඩපිළිවෙළට උපදෙස් දුන්නා පමණක් නොවෙයි, එතුමා එතුමාගේ මිත්‍රයිනුත් විශාල වශයෙන් ධන පරිත්‍යාග කරන්න උනන්දු කරවූවා. රුපියල් ලක්ෂ 40 ක් විතර දැනටමත් ඒ ගොඩනැගිලි සංකීර්ණයට වියදම් කරල තිබෙනව. අපේ හිතවත් දේශබන්දු එච්. කේ. ධර්මදාස මැතිතුමා මේ කාර්‍ය සඳහා හුඟක් උදව් උපකාර කරල තිබෙනව. ඒ නිසා මං ඒ හැමදෙනාටම මගේ කෘතඥතාවය පිරිනමන්න කැමතියි.

මං බොහෝම කැමති ව්‍යායාමයක් ළදරු අධ්‍යාපනය, කුඩා කාලයේදී අපේ කුඩා දරුවන්ගෙ මනස නිසි විදියට සකස් කර ගැනීම ඉතාමත් ම අවශ්‍ය යි. පැළයක් උනත්, කුඩා කාලයේ දී තමයි හොඳින් රැකබලා ගන්න ඕන. මේ විදියට තමයි, අපේ ළදරුවන් අපි රැක බලා ගත යුත්තෙ. කුඩා කාලයේ දී ඔවුන්ගේ ගතටත් සිතටත් ලැබෙන්නා වූ ශක්තිය අනුව තමයි, වැඩිහිටි වියේ දී ඔවුන්ට ඕනෑම අභියෝගයකට මුහුණපාන්නට පුළුවන්කම ලැබෙන්නේ. දැන් පුංචි කාලේ අපේ දෙමව්පියෝ බොහොම සැලකිල්ලකින් තමන්ගේ දරුවන්ගෙ කාය ශක්තිය වැඩි වර්ධනය කරන්න උවමනා කරන පදාර්ථ හා පෝෂ්‍යදායක දේ ලබාදීමට උනන්දුවෙනවා. රෝගවලින් වළක්වා ගැනීමට වුවමනා කරන ප්‍රතිකර්ම පුංචි කාලෙදී ම ලබාදෙනවා. මාසෙදී, දෙකේදී, තුනේදී, මාස හයේදී, අවුරුද්දෙදී, අවුරුදු තුනේ දී ඔය ආකාරයට ගත ශක්තිමත් කර ගන්නවා. කුඩා දරුවන්ගෙ ශරීරය පෝෂණය කරන්න මව්පියවරු බොහෝම වෙහෙසෙනව මහන්සිවෙනව. ඒ විදියටම අපි වෙහෙසෙන්න ඕන. මහන්සි

වෙන්න ඔන කුඩා කාලයේදී අපේ දරුවන්ගෙ සිතන් සකස් කරන්න. සමහරු හිතනව ඇති මේ පුංචි ළදරුවාට මොකක් ද තියෙන සිත කියල. එසේ සිතන්නෙ නොදැනුවත්කම නිසා. පුංචි කාලෙදී තමයි, ළදරු වියේදී ම තමයි ශරීරය වැඩෙනවා වාගේ මනසත් වැඩෙන්නෙ. ඒ මනස වචනයෙන් ප්‍රකාශ නූනට උපනන් සමහම ජීවිතයට සම්බන්ධ වෙනව. කුඩා කාලයේ දී ඒ මනස, ඒ හිත සකස් කරන්න. ගන සකස් කරන්න, පෝෂණය කරන්න, ක්‍රියා කරනවා වාගේම ක්‍රියා කළ යුතුව තිබෙනව. ජපන් රට මේ අතින් ඉතා උසස් ආදර්ශයක් දීල තියෙනවා. පුංචි කාලෙ ම තමයි ළදරු අධ්‍යාපන ක්‍රමය තුළින් දරුවන්ගේ හිත සකස් කරන්න ක්‍රියා කරන්නෙ. ඒ වැඩපිළිවෙලේ ඉතාමත් ම ප්‍රවීණයෙක් තමයි, මහාචාර්ය කුබෝතා මහතා. එවැනි ළදරු අධ්‍යාපනය පිළිබඳ ප්‍රවීණ විශේෂඥයෙක් බඳගිරියේ සෝමවංශ ස්වාමීන් වහන්සේට හමුවී මේ ප්‍රතිඵලය නිසා තමයි, අද අප සියලුදෙනාටම මේ විදියේ උසස් අවස්ථාවකට සහභාගී වෙන්න ලැබිල තියෙන්නෙ. දැන් වෛද්‍ය වෘත්තියේ දී කුඩා දරුවන්ගෙ සනීපය පිළිබඳව සොයා බැලීමත් විශේෂඥ දෙයක් හැටියට සලකනව. ඒ වගේම තමයි කුඩා දරුවන්ගේත් මානසික නිරෝගී භාවය සම්බන්ධයෙන් විශේෂ දැනුමක් ඇතුව ක්‍රියා කරන්නෙ. මහාචාර්ය කුබෝතා මහතා ළමා මනස පිළිබඳව හා ළමා මනස සකස් කිරීම පිළිබඳව උසස් දැනුමක් ඇති කෙනෙක්. මේ දැනුම අවශ්‍ය යි අපේ ගුරුවරුන්ටත්. ළදරු අධ්‍යාපනයේ ක්‍රියාත්මක වන මූලධර්ම ඉතා උසස්. ඒ නිසා මෙ ජාතික ළමා අධ්‍යාපන පදනමේ ප්‍රධාන අරමුණක් තමයි ළදරු අධ්‍යාපනයට යොමු වුණ ගුරුවරුන්ට ඒ පිළිබඳ පුහුණුවක් ලබා දීම. දැන් මාස කීපයකට ඉස්සෙල්ල මට අවස්ථාව ලැබුණ මේ ළදරු අධ්‍යාපන පදනමින් පුහුණුව ලබපු ගුරුවරුන්ට සහතික පත්‍ර බෙදා දීමට. මුළු රටෙන් ම තෝරා ගත්ත ; තවත් රට පුරාම එවැනි සේවාවන්ට ඉදිරිපත් වෙන අයට පුහුණුව දෙන්න බලාපොරොත්තු වෙනව. මේ ස්ථානයේ ළදරු අධ්‍යාපනය පිළිබඳව ආදර්ශ පාසලකුත් පවත්වනව. ඒ නිසයි මං කල්පනා කළේ අපි අද සියලුදෙනාම සහභාගි වන්නෙ ඉතා විශිෂ්ට වැඩ පිළිවෙලකට බව.

අපි කවුරුත් වැඩිහිටියො ජීවත් වෙන්නෙ කුමක් සඳහා ද ? අපේ අනාගත පරම්පරාව සඳහා. හැම අම්මා කෙනෙක් ම, හැම තාත්තා කෙනෙක් ම හැම වැඩිහිටියෙක් ම නිරන්තරයෙන් ම හිතන්නෙ තමන් ගැන හිතනවාට වඩා තමන්ගෙ දූ දරුවන් ගැන. ඒ තමයි බලාපොරොත්තුව. ස්වල්ප කලක් අපි ජීවත් වෙනව. ඊළඟට ඒ වගකීම අපේ හැදී වැඩීගෙන එන දරු පරම්පරාවට ලැබෙනව යි කියන හැඟීම උඩයි හැම දෙනාම වැඩ කරන්නෙ. එහෙම කල්පනා කරන කොට අපේ රටේ අනාගත වගකීම, අපේ රටේ අනාගත ඉරණම, බාරගන්නෙ අපේ ළමා පරපුර. ඔවුන් හද වඩාගන්න ඕනෙ ළමා අවදියේ ඉඳලම. ඒකට විශිෂ්ට ආදර්ශය අපට ජපන් රටෙන් ලැබෙනව. මං මේ ඊයෙ පෙරේද ජගත් නිවාස වර්ෂය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපෙ සම්මේලනයක් අමතා ප්‍රධාන දේශනය පවත්වන්න ජපන් රටට ගියා. ඒ වෙලාවෙත් මට අවකාශයක් ලැබුණ ජපන් ළදරු අධ්‍යාපන ක්‍රමය පිළිබඳව හැඟීමක් ලබා ගන්න. ඒ අනින් අපට විශිෂ්ට ආදර්ශයක් ජපන් රටෙන් ලැබෙනව. මට පෙනෙනව සිය ගණනක් ජපන් ජාතික බෞද්ධ පින්වතුන් අද මේ අවස්ථාවට සහභාගි වෙනව.

ශ්‍රී ලංකාවේ හැම වැඩ පිළිවෙළකටම ජපන් රටින්, ජපන් ජනතාවගෙන් උදව් උපකාර ලැබෙනව. අපේ රට පිළිබඳව විශේෂ කෘතවේදීත්වයක් තිබෙනව ජපන් ජනතාව තුළ. විශේෂයෙන්ම පසුගිය ලෝක මහා සංග්‍රාමයේ දී පරාජය වෙලා. ඇද වැටිල හිටපු වෙලාවෙ ශ්‍රී ලංකාවෙන් ජපන් ජනතාවට ලැබුණ ධෛර්යය ඔවුන් කවදාවත් අමතක කරන්නෙ නැහැ. තමුන්නාන්සේලාට මතක ඇති අපේ වර්තමාන ජනාධිපති ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මුදල් ඇමති හැටියට, එද අපේ රටේ අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා නියෝජනය කරමින් සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර සාම සම්මේලනයේ දී කළ කථාව. නොයෙක් බලවත් ජාතීන් මේ වැටුණ, පැරදුණ ජපන් රට පාගා දමන්න ක්‍රියා කරන වෙලාවෙ " වෛරයෙන් වෛරය සංසිදෙන්නෙ නෑ. වෛරය සංසිදෙන්නේ අවෛරයෙන් " කියල බුදුරජාණන්වහන්සේගේ වදන මතක් කරල එද ජපන් රටට නැඟී සිටීමේ අවස්ථාව ලබා දුන්න. ඒ

ගැන ඔවුන් තුළ ඉතාමත් කෘතවේදීත්වයක් තිබෙනව. අපේ රටේ සංඝරත්නය කීපනමක් ඒ රටට වැඩම කරවාගෙන ගිහින් බුද්ධ ධර්මය පිළිබඳ ආභාෂය ලබා ගත්ත. ඒ සංඝරත්නය එතුමන්ලාගේ උදව් උපකාර ලබාගෙන මේ රටේ විවිධ පළාත්වල විශාල ශාසනික සංග්‍රහයක් කළා. අපේ බද්දේගම විමලවංශ අනුනායක ස්වාමීන්වහන්සේගෙ ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලා කීපනමක් මේ වැඩපිළිවෙලේ ප්‍රමුඛත්වය ගත්ත. ඒ සීලොගම ස්වාමීන්වහන්සේ මට පෙනෙනව මේ ස්ථානයේ වැඩ සිටිනව. ඒ වගේ ස්වාමීන්වහන්සේලා කීපනමක් හොඳ කීර්තිමත් සේවාවක් ඉටු කළා.

ඒ නිසා අපි කවුරුත් නිරන්තරයෙන්ම කල්පනා කරන්න ඕන අපි කොයි වැඩ පිළිවෙළකට යොමු වුනත් අපේ රටේ, අපේ සමාජයේ, අනාගතය ගැන කල්පනා කරන්නෙ නැතුව ක්‍රියා නොකරන්න. බුද්ධ ධර්මය අනුව අපි දන්නව උපන්නොත් මැරෙන බව. ඇති උනොත් නැති වෙන බව. ඒ නිසා අපි නිරතුරුව ම කල්පනා කරන්න ඕන අපි නැති වුනත් අපේ අනාගත පරම්පරාවට අනාගත සමාජයට යහපත් තත්ත්වයක් ඇති වීමට ඕනැ කරන විදියට ක්‍රියා කරන්න. හැම කාය්‍ර්‍යයකදීම හිතින්, කයින්, වචනයෙන් මේ විදියෙ හැඟීමක් ඇතිව අපි වැඩ කරන්න ඕන. මොනම අර්බුදයකදී උනත් ඒ හැඟීමෙන් බැහැරව අපි යන්න නරකයි.

අද මං දන්නව මේ ශ්‍රී ලංකාවේ ජනතාව දැන් නිරතුරුව ම කල්පනා කරන්නෙ අපේ රටේ අනාගතය ගැන. මෑන කාලයෙ නමුන්නාන්සේලා දන්නව උතුරෙන් නැගෙනහිරන් සුළු පිරිසක් අවි ආයුධ අතට අරගෙන ත්‍රස්තවාදය තුළින් විමුක්තියක් ලබන්න ඕනැ යි කියල දරුණුම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. දැන් අවුරුදු දහයක් පහලොවක් තුළ මේ වැඩපිළිවෙළ බුර බුරා නැගී ආව. දහස් ගණන් ජනතාව අමු අමුවෙ මරා දැම්ම. පොදු යහපතට අදාළ වටිනා ප්‍රයෝජනවත්, පොදු සහ පෞද්ගලික ගොඩනැගිලි ආයතන රැසක් විනාශ කර දැම්ම. ඒ රටේ අනාගතය ගැන කල්පනා කරමින් කළ දෙයක් නොවෙයි. ප්‍රශ්ණයක් විසඳගන්න මිනිසාට අවි ආයුධ අවශ්‍ය නැහැ. එහෙම නම් මිනිසාට මනසක් තිබෙන්නෙ කුමක්

සඳහා ද ? මිනිසා සැදී පැහැදී සිටින ස්වභාවය ගැන කල්පනා කරල බලන්න. අපේ ඇඟ පත උනුත් සකස් කරල තිබෙන්නෙ සාමකාමීව ජීවත්වීමේ ඌරුවකට. හැඩ රුවකට. වන මෘගයින්ට වගේ මරාගෙන හපාගෙන කඩාගෙන ජීවත්වන්නට ඕනැකරන අඟ පසඟ ස්වභාවධර්මය අපට දීල නැහැ. අපට දීල තිබෙන අඟපසඟ මොනවා ද ? අපට උසස් සිතක් දීල තිබෙනව. උසස් ගතක් දීල තිබෙනව. මේ ශරීරය මොනම අංගයකින් වත් කාටවත් විපතක් කරන ආකාරයෙන් සකස් වෙලා නැහැ. නමුත් අපට හිතක් දීල තිබෙනව. ඒ හිත අනුව කථා කිරීමට, හිත අනුව බැලීමට, ඒ හිත අනුව ක්‍රියා කිරීමට, ඕන කරන අඟපසඟ අපට ස්වභාව ධර්මයෙන් දීල තියෙනව. එහෙනම් අපි කල්පනා කරන්න ඕන ඕනෑම අර්බුදයකදී, ඕනෑම අභියෝගයක්, ඕනෑම ප්‍රශ්නයක් මිනිසුන් හැටියට විසඳන්නට අධිෂ්ඨාන කරගන්න ඕන. ඒ මනුෂ්‍යකමින් බැහැරව අපට තිබෙන ප්‍රශ්න විසඳගන්න අවි ආයුධ අතට ගන්නව නම්, තිරස්චීනව ක්‍රියා කරනව නම්, එය මනුෂ්‍යකමට ගැලපෙන්නෙ නැහැ. මෙන්න මේ අධ්‍යයනය, මෙන්න මේ පුහුණුව, මෙන්න මේ පුරුද්ද, දරුවන්ගෙ කුඩා කාලයේදී ම ඔවුන්ගේ සිත්සතන්වලට ඇතුල්වන්න ඕන. ආගමික අධ්‍යාපනයේ තිබෙන වැදගත්කම එතනයි. අපේ ආගමික අධ්‍යාපනය යම් දවසක බිඳ වැටුණද එද පටන්ම හැදී වැඩී ගෙන එන පරම්පරාවේ සිත්සතන් නොමඟට ගිය බව අපට පේනව.

අපට ඕනම දෙයක් හිංසාවෙන් තොරව පරුෂබවින් තොරව ඉටුකරගන්න පුළුවන්, උසස් මතයක් දායාද කොට ගෙන ඉන්නව යි කියල. අන්න ඒ දැනුම, ඒ පුරුද්ද නැති කරගත්ත කොටසක් තමයි තමන්ගේ විමුක්තිය සඳහාය, තමන්ගෙ ජනතාවගේ අභිවෘද්ධිය සඳහාය කියල අවි ආයුධ අරගෙන මේ අවුරුදු 10–15 ක් මුළුල්ලෙ ඒ ත්‍රස්තවාදී ක්‍රියාදාමය ඉතා උත්සන්න අවස්ථාවකට පත් කළේ. ඇත්තවශයෙන්ම උතුරෙන් නැගෙනහිරන් ඇතිවෙච්ච මේ ත්‍රස්තවාදී ක්‍රියාදාමය ගැන අපි කවුරුත් කල්පනා කරන්න ඕන. ඇතැම් අයට වැරදි ස්වරූපයක් පෙන්නා දුන්න මුළු ලෝකයම මුලා උනා මේ ත්‍රස්තවාදී පිරිය සටන් කරන්නෙ භාෂා

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අයිතියක් ලබාගන්න, මානුෂික අයිතියක් ලබාගන්න, උරුමයක් ලබාගන්නෙයි කියල. හැමදෙනාගේම ඇස්වලට වැලි ගසමින් නමුත්තාන්සේල දන්නව ගෙනගිය දරුණු ත්‍රස්තවාදී වැඩපිළිවෙළ. මීට අවුරුදු හතරකට විතර ඉස්සර මේ පිළිබඳව මට අවස්ථාවක් ලැබුණ විශේෂ අධ්‍යයනයක් කරන්න. මම තොරතුරු හැම දෙයක්ම සොයා බැලුව. මට උගන්වපු ගුරුවරු මට පුරුදුකර තිබෙන්නෙ, යමක් ගැන හිතනව නම්, යමක් ගැන කියනව නම්, යමක් ක්‍රියාත්මක කරනව නම්, එහි හැම පැත්තක් ම බලල සත්‍ය තොරතුරු සොයාගෙන ඒ අනුව අහිතව, අදීනව හිතන්න ය, කියන්න ය, ක්‍රියාකරන්න ය කියල. මම ගිය දහම් පාසැල්වලින් මම ඉගෙනගත්ත දේ තමයි අපේ බුදු රජාණන් වහන්සේ හැම අවස්ථාවකදී ම හැම පැත්තක් ම බලල කරුණු අධ්‍යයනය කරන්නෙ යි කියල කියා දුන්න බව. උන්වහන්සේ දේශනා කළ චතුරාර්‍ය සත්‍ය ධර්මයෙන් උගන්වන්නෙ මොකක් ද ? ප්‍රශ්නයක් තේරුම් ගන්නට ඕනෑ කරන ඉතාමත්ම වැදගත් ක්‍රියා මාර්ග 4 ක් උන්වහන්සේ අපට උගන්වල තිබෙනව. ඕනෑම ප්‍රශ්නයකට ඒ ක්‍රියා මාර්ග හතර අපි ක්‍රියාත්මක කරන්න ඕන. ඒ නිසා මේ ත්‍රස්තවාදය පිළිබඳව මට අවකාශයක් ලැබුන තොරතුරු සොයා බලන්න. නමුත්තාන්සේල දන්නව අපි ජාති භේදය උඩ, භාෂා භේදය උඩ ක්‍රියා කිරීමට හුරු පුරුදු වෙච්ච පිරිසක් නොවෙයි කියල. අපි බෞද්ධයින් හැටියට ඉගෙනගත්ත ඉතාමත්ම ශ්‍රේෂ්ඨ පාඩම තමයි මනුෂ්‍යත්වය අගය කිරීම. බුදුරජාණන්වහන්සේ මනුෂ්‍යත්වයෙනුත් ඔබ්බට ගිහිල්ලයි අපට ඉගැන්නුවෙ සියලු සත්වයින් කෙරෙහි මෛත්‍රියක්, කරුණාවක්, දයාවක්, අනුකම්පාවක් ඇතිව ක්‍රියා කරන්න කියල. ගහ කොළ පවා මහා පෘථිවිය හා ස්වභාව ධර්මය පවා උන්වහන්සේගේ විෂය ක්ෂේත්‍රයට අදාළයි. ඒ නියා අපට පුළුවන් උනා, මේ තොරතුරු සොයා ගන්න. මොකක් ද අපට සොයා ගන්න පුළුවන් උනේ.

මේ ත්‍රස්තවාදී පිරිසට මේ විදියට මේ රටේ අති විශාල ජනකායක් බියටත් සැකයටත් පත් කරන්න පුළුවන්කම ලැබුණෙ කොහොමද ? අපේ ආරක්ෂක යන්ත්‍රද හමුදාවන් පසුබාමින් මේ විදියට මේ පිරිසට මේ

ත්‍රස්තවාදී ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න පුළුවන් උනේ කොහොමද ? මගේ අධ්‍යයනයට හසුවෙච්ච කරුණු තමයි. මං මේ අවුරුදු තුනක් හතරක් මුළුල්ලේම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ. පිටින් ආධාරයක් නොලබා මේ ආකාරයේ දරුණු තත්ත්වයක් ඔවුන්ට ඇති කරන්න බැරි බව අපි ප්‍රකාශ කළා. ඉන්දිරා ගාන්ධි අගමැතිණියගෙ කාලෙ ඉඳලම මම පාර්ලිමේන්තුවෙත් ඉන් පිටතත් නොවළහා ප්‍රකාශ කළා මේ ත්‍රස්තවාදී පිරිස අපට බලා හදගන්නට පුළුවන් ඉන්දියාවේ රැකවරණය නොලැබෙනවානම්. ඉන්දියාවේ පුහුණු කඳවුරු ඇතිකරගෙන පුහුණුව ලැබගෙන මේ හැතැප්ම 20ක් පමණ දුර ප්‍රමාණය කඩා බිඳගෙන මෙහාට ඇවිල්ල මේ වැඩපිළිවෙල කරන තාක් කල් මේ මර්ධනය කරන්න පුළුවන් කමක් නැති බව මම ප්‍රකාශ කළ ආකාරය තමුන්නාන්සේලාට මතක ඇති. බොහෝදෙනෙක් කිව්ව ඒ ආකල්පය වැරදි යි කියල. දැන් ඔප්පුවෙලා තිබෙනව, ඉන්දියාවේ ආධාරය නතර වෙච්ච හැටියෙම උතුරෙන් නැගෙනහිරන් ත්‍රස්තවාදය බිඳවැටිල තියෙන බව. මේක මම කියපු වෙලාවෙ නොයෙක් අය මට ඇවිත් කිව්ව ඔක දිගටම කියන්න එපා. වැඩි දෙනෙක් පිළිගන්නෙ නෑ. මං කිව්ව මම ඉගෙන ගෙන තියෙන්නෙ වැඩි දෙනෙක් පිළිගන්න දේ කියන්න නොවෙයි. වැඩි දෙනෙකුට කවදා හරි පිළිගැනෙන දේ කියන්නෙ යි කියල මම ඒ අවස්ථාවෙ කිව්ව. දැන් මුළු ලෝකෙම පිළිගන්නව. මුළු ලෝකෙම විතරක් නෙමෙයි අවි බිම තියපු ත්‍රස්තවාදීන් පවා. ත්‍රස්ත්‍රවාදී නායකයින් පවා කියනව " ඉන්දියාවත් එක්ක අපට සටන් කරන්න බෑ කියල. ඉන්දියාව අපට කියල තියෙනව අවි බිම තියන්නෙ යි කියල. ඔන්න අපි ගන්න අවි බිම තිබ්බ " යි කියල. දැන් මේ දවස්වල රූපවාහිණියෙන් පෙන්නනව ඒ අය ආයුධ භාර දෙනව. මොන තරම් අවි ආයුධ තිබුණ ද කියල අපට පේනව. ඔය බොහොම ටිකයි දකින්න ලැබුණේ. දැන් ඕනම කෙනෙක්ගෙ හිතේ නැගියනව දෙය්යනේ කොහොමද මේව මෙහාට ආවෙ, මොන පාරෙන් ද ආවෙ ? මහ මුහුදෙන් වටවෙලා තිබෙන මේ ශ්‍රී ලංකාවට මේ තරම් බර මේ තරම් දරුණු ආයුධ ආවෙ කොහොමද කියල. මේවාට සල්ලි දුන්නෙ කවුද ? මේවා එව්වේ කව්ද ? කොහොමද මේ තරම් දෙයක් මේ රට ඇතුළට ආවෙ. මේව ප්‍රශ්න. තමුන්නාන්සේලාගේ හෘද සාක්ෂිය විසින් පිළිතුරු දිය යුතු ප්‍රශ්න.

දැන් තමුන්නාන්සේලාට පේනව ඇති යම් කාරණයක් ගැන හොඳින් අධ්‍යයනය කරල තොරතුරු හොයල බලල හිතල මතල ප්‍රකාශ කලොත් කවදාවත් ඒක බොරුවෙන්නෙ නැති බව. තාවකාලිකව සමහරවිට සමහර උදවිය නොපිළිගත්තත් අවසානයේ දී සත්‍ය ජය ගන්නා බව තමුන්නාන්සේල දන්නව. ඒ නිසා සතුටුවෙන්න ඕනෙ. ප්‍රමාද වෙලා උනත් මේ තත්ත්වය අපට දැකගන්නට පුළුවන්වීම ගැන. මෙවැනි සත්‍ය වන කාරණයක් කියන්නට මට පුළුවන් උනේ ඒ ගැන හොඳට කරුණු සොයා බලල හිතා මතා ප්‍රකාශ කල නිසයි. තමුන්නාන්සේල දන්නව මේ ත්‍රස්තවාදී ප්‍රශ්නය විසඳීමට දැන් කාලයක් මුළුල්ලේ අපේ රජය නොයෙක් ආකාරයේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කළා. ලෝකය මොනවද කියන්නෙ, අපේ රටේ විවිධ අංශ මොනව ද කියන්නෙ, ඒ හැම දෙයක්ම සලකා බලා, අපේ ජනාධිපතිතුමත්, අපේ රජයත් නොයෙක් ව්‍යාපාර ආරම්භ කළා. ජනසම්මතවාදී පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂය—අපේ ආණ්ඩුව වට මේස සාකච්ඡා තිබ්බා, හතරැස් මේස සාකච්ඡා තිබ්බා, තුන් හුලස් සාකච්ඡා තිබ්බා, තිම්පු සාකච්ඡා තිබ්බා. දැන් ලොකු අසනීපයක් හැදිල ගෙදර ලෙඩෙක් ඉන්න කොට නොයෙක් නොයෙක් අය ඇවිල්ල කියනව, " අර වෙද මහත්තය ගාවට යන්න ", එතෙන්ට දුවනව. " අහවල් දෙස්තර මහත්මය ගාවට යන්න " එතෙන්ටත් දුවනව. " අහවල් බලිය අරින්න. " ඒකත් කරනව. " අහවල් අංජනම බලන්න. " ඒකත් කරනව. ඒ ගෙදර ඉන්න වැඩිහිටියො ; ඉතින් කවුරුත් සතුටු කරන්න ඕන. නැත්නම් කියන්නෙ මේ මනුස්සය මළේ මේක නොකරපු හින්ද " යි කියල. ඒ නිසා බලි තොවිල් අරව මේව ඔක්කොම කරනව. අපි ඒ වගේ කියන කියන විදිහෙ සාකච්ඡාවල්, සම්මන්ත්‍රණ, නොයක් දේවල් ක්‍රියාත්මක කළා. තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති මේ ක්‍රියාමාර්ගය ගෙනයෑම ඉතාමත් සුදුසු යි. නමුත් මේ හැමදේකදීම මගේ හිතේ තිබ්බව එක කාරණයක් තමයි ඉන්දියාවෙ රැකවරණ නොලැබ්බව දට මේ ත්‍රස්තවාදය නතර වෙනව යි කියල. දැන් මං කිව්ව වගේ ඒක ඉටුවී තිබෙනව. මෙවර මං පිටරට යන අවස්ථාවේදී තමුන්නාන්සේල දන්නව මේ කාරණාවල් ගැන අපේ රජය අවධානය යොමු කරල තිබුණ.

මම පිටරට ඉන්න කාලේ විශේෂයෙන්ම ජපානයට ආපු අවස්ථාවෙ ජපන් රූපවාහිණී සේවය මාව හමුවෙන්න ඇවිල්ල කිව්ව, " සාකච්ඡාවක් ඇති වෙලා තිබෙනව. ලංකාවේ ත්‍රස්තවාදීන්ට උතුර සහ නැගෙනහිර සම්පූර්ණ බලතල සහිතව වෙන්කරල දෙන්න ". මේ ගැන තමුන්නාන්සේගේ අදහස මොකක් ද කියල. මගේ හිතේ තමුන්නාන්සේල ශ්‍රී ලංකාවෙ රූපවාහිනියෙනුත් ඒ සාකච්ඡාව දකින්න ඇති. ලංකාවෙ ප්‍රවෘත්ති පත්‍රවලත් ඒ සාකච්ඡාවෙ තොරතුරු පළ උනා. ඒ වගේම ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය ඒ අවස්ථාවේදී මං දීපු පිළිතුරු ප්‍රකාශයට පත් කළා. ඒ වගේම ජපන් රටේ ඉන්න ශ්‍රී ලාංකික ජනතාවත් මේ ආරංචිය ලැබිල ඇත්ත තත්ත්වය දැනගන්න ඕනැ යි කියල කරුණු විමසුවා. ජපන් රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට ඇවිත් එහි පැවති පිළිගැනීමේ උත්සවයකදී ඔවුත් එසේ කරුණු විමසුවා. මං මොකක් ද ඒ අවස්ථාවෙ කිව්වෙ ? මං කිව්ව, මං අහවල් දවසෙ රටින් පිට උනෙ. මම දන්නෙ නෑ මේ පිළිබඳව තොරතුරු. යම් සාකච්ඡාවක් ඇති උනා නම්, ඒකෙන් ඇති කර ගත්තු තීරණ මම දන්නෙ නෑ. නමුත් මට එකක් කියන්න පුළුවන්, මොන විසඳුමක් ඇති උනත් ඒ විසඳුම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟව ක්‍රියාත්මක වෙනව යි කියල. මම කිව්ව, අපේ ජනාධිපතිතුමන් අපේ කැබිනට් මණ්ඩලයත් අපේ මන්ත්‍රීවරුන් කවදාවත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට තිබෙන ශ්‍රී ලංකාවෙ ස්වෛරීත්වය, ශ්‍රී ලංකාවෙ ස්වාධීනත්වය, ශ්‍රී ලංකාවෙ ඒකීය භාවය, ශ්‍රී ලංකාවෙ භෞමික අඛණ්ඩතාවය බිඳෙන විදියේ කිසිම ක්‍රියා මාර්ගයකට එකඟ නොවන බව මට ඒකාන්තයෙන්ම විශ්වාස යි කියල මම එදා ප්‍රකාශ කළා. ඒ වගේම තමුන්නාන්සේලාට මතක ඇති මේ ප්‍රශ්ණය ගැන පාර්ලිමේන්තුවෙදීත් පිටතදීත් කථා කළ හැම අවස්ථාවකම මම අපේ රජයට එක ස්ථාවරයක් පැහැදිලි ලෙස කිව්ව. ඒ ස්ථාවරයේ ඉතාමත්ම වැදගත් කොටසක් ගිය අප්‍රේල් මාසෙ ජනාධිපතිතුමන්ගෙ ප්‍රධානත්වයෙන් පැවති අපේ ආණ්ඩු පක්ෂ රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් ම සම්මත උනා. මොකක්ද ඒ ස්ථාවරය. අපි දේශපාලන විසඳුමක් ක්‍රියාත්මක කරන්නෙ, ත්‍රස්තවාදීන් අවි බිම තියල සාමය ඇතිකළාට පස්සෙ. ය කියන එකයි අපි ඇතිකරගත්ත ස්ථාවරය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

තමුන්නාන්සේලාට මතක ඇති මම පාර්ලිමේන්තුවේදිත් කියල තියෙනව. ඊළඟට අපි දිගටම කියාගෙන ආපු දෙයක් තමයි අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට අපි කිසිම දෙයක් කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ යි කියන එක. මම ඇයි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන කියන්නෙ ? 1978 සම්මත කරගත්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ රටේ පොදු ජනතාවගෙ අයිතිය රකින ව්‍යවස්ථාවක් පමණක් නෙවෙයි අපේ රට කවදාවත් දෙකඩ කරන්න බැරි ව්‍යවස්ථාවක් බව මං තමුන්නාන්සේලාට පෙන්නා දෙන්න කැමතියි. තමුන්නාන්සේලා කවුරුත් මෙ ව්‍යවස්ථාව අධ්‍යයනය කරන්න ඕන. ඉතාමත්ම වැදගත් ව්‍යවස්ථාවක්. මේ රටේ ස්වෛරීත්වය. ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය මෙ ව්‍යවස්ථාවට ගැබ් කරල තිබෙන්නෙ වචනයෙන් පමණක් නෙවෙයි. අපේ රටේ නිදහස නැති කරල, අපේ රටේ ඒකීය භාවය නැති කරල අපේ රටේ භෞමික අඛණ්ඩතාවය නැති කරල, අප රට ඇතුලෙ වෙනම රාජ්‍ය ඇති කරන්න උත්සාහ කරන කිසිම වැයමකට මෙ ව්‍යවස්ථාව තුළ අවකාශයක් නැහැ. දැන් සමහර උදවිය හිතන්න පුළුවන්. "ඔව්, ඔහොම කිව්වට ආණ්ඩුවක ඉන්න මන්ත්‍රීවරුන් එකතු වෙලා ඒක කරන්න පුළුවන් නේද කියල." නැහැ. අපේ මේ ව්‍යවස්ථාව පිළිබඳව මං කැමතියි තමුන්නාන්සේලාට විස්තර කරල දෙන්න.

මෙ ව්‍යවස්ථාව යටතෙ තමයි, මුළු රටේම ජනතාවගෙ කැමැත්තෙන් ජනාධිපතිවරයෙක් තෝරන්නෙ. අද මේ ව්‍යවස්ථාවෙන් ඇති කරල තිබෙන ජනාධිපති ධූරය සම්පූර්ණ කරන්නෙ, අගමැතිවරයගෙ නිර්දේශ අනුව නෙවෙයි. මන්ත්‍රී මණ්ඩලයේ පත් කිරීම අනුව නෙවෙයි. ලංකාවේ හැම ඡන්ද දායකයේක්ම ඡන්දය පාවිච්චි කරලයි. එහෙම ඡන්දෙ පාවිච්චි කරල වැඩි ඡන්දයෙනුත් නෙවෙයි. සාමාන්‍ය වැඩි ඡන්දයකින් ජනාධිපතිවරයෙකු තෝරගන්න අමාරුයි. ප්‍රථමවරට, ඡන්දය පාවිච්චි කරන ජනතාවගෙන් 50% කට වැඩිය ඡන්දය පාවිච්චි කරන්න ඕන. ඒ නිසා තමයි අපේ රටේ අද තිබෙන්නෙ විධායක ජනාධිපති ධූරයක්. ඒ විධායක ජනාධිපති ධූරයට අපි ඇතුළත් කර ඇති බලතල මොනවද ? විධායක බලතල පමණයි. තිබෙන නීති රීති අනුව ඒ විධායක

ජනාධිපතිතුමාගෙ බලතල විග්‍රහ කරල තිබෙනව. ඒ විධායක ජනාධිපතිතුමාට අලුතෙන් නීති රීති උවමනා නම් ඒ නීති රීති පැනවීමේ බලය විධායක ජනාධිපතිතුමාට දීල නෑ ව්‍යවස්ථාවෙ. ව්‍යවස්ථාව කියන්නෙ, අළුතෙන් නීති රීති උවමනා නම් විධායක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ලව්වා ඒක සම්මත කරවන්න ඕන. බලන්න කොයිතරම ශක්තිමත් ව්‍යවස්ථාවක් ද කියල. විධායක ජනාධිපතිතුමත් ව්‍යවස්ථාදයක පාර්ලිමේන්තුවත් එකට එකතු උනත් ඒ නීති රීති සම්මත කරන්න බෑ. එහෙනම් මොකක්ද කරන්න තිබෙන්නෙ? ඒ පාර්ලිමේන්තුවට එවන නීති රීති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා ය කියල දැනුම් දුන්නට පස්සෙ, ඒ නීතිය ආණ්ඩුවෙ ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෙ. එසේ පළ කළාට පස්සෙ පාර්ලිමේන්තුවෙ සාකච්ඡා වෙන්න ඉස්සෙල්ලා ලංකාවේ ඕනෑම පුරවැසියෙකුට මෙ ව්‍යවස්ථාවෙන් අපේ ස්වෛරීත්වය නැතිවෙනව. අපේ ඒකීය ගාවය නැති වෙනව. අපේ භෞමික අඛණ්ඩතාවය නැති වෙනව යි කියල සුප්‍රීම් උසාවියේ මෙ ඉදිරිපත් කරපු ව්‍යවස්ථා කෙටුම්පත පරීක්ෂා කරන්නෙ යි කියල ඉල්ලන්න පුළුවන්.

එතකොට සුප්‍රීම් උසාවියෙ මෙක නඩුවක් වාගෙ සාකච්ජා කරල අධිකරණය තමයි කියන්නෙ ඔව්, මෙ ව්‍යවස්ථාව සාමාන්‍ය ජන්දයෙන් පාර්ලිමේන්තුවෙ. සම්මත කරන්න පුළුවන්. එහෙම නැත්නම් මෙ ව්‍යවස්ථාව සම්මත කරන්න පාර්ලිමේන්තුවෙ 2/3ක ජන්දය ගන්න ඕන. එහෙම නැත්නම් මේ ව්‍යවස්ථාව 2/3ක ජන්දයෙන්වත් සම්මත කරන්න බෑ : මෙ ව්‍යවස්ථාවෙන් ජනතාවගේ ජන්ද බලය පිළිබඳ ප්‍රශ්ණ මතු වෙනව. රටේ ස්වෛරීත්වය පිළිබඳ ප්‍රශ්ණ මතු වෙනව. ඒ නිසා මෙ ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන්න නම් පාර්ලිමේන්තුවෙ 2/3ක බලයකුත් ජනමත විචාරණයකුත් පවත්වලා ජනතාවගේ කැමැත්තත් ලබා ගන්න ඕනෑ යි කියල මෙ ව්‍යවස්ථාවෙ තිබෙනව. බලන්න කොයි තරම ශක්තිමත් ව්‍යවස්ථාවක් ද් අපට තිබෙන්නෙ කියල. ඒ නිසා සහෝදර සහෝදරියනි, අපි කිසිම දේකින් වංචලවන්න උවමනා නැහැ. කලබල වන්න උවමනා නැහැ. ඕලාරික වන්න උවමනා නැහැ.

මේ ව්‍යවස්ථාව තුළ තමුන්නාන්සේලාගේ ස්වෛරීත්වය පරමාධිපත්‍යය සහතික කරල තිබෙනව. මීට කලින් තිබුණ මොනම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකවත් මේ අයිතිය ජනතාවට සහතික කරල තිබුණේ නෑ. 2/3 බලයෙන් ඕනෑම එකක් සම්මත කරගන්න පුළුවන්කම තිබුණ. දැන් බලන්න. අපේ ජනාධිපතිතුමත් ඉන්දියාවෙ අගමැතිතුමත් මේ නොබෝද ගිවිසුමක් ඇති කරගත්ත. දෙදෙනම රාජ්‍ය නායකයෝ දෙදෙනෙක්. ඒ අතින් අපේ ජනාධිපතිතුමා විශිෂ්ට තත්වයකින් ඉන්නෙ. මුළු රටේම මහජනතාව තෝරා පත්කර ගත්ත රාජ්‍ය නායකයෙක්. අවුරුදු 40 ගණනක පරිණත දේශපාලන බුද්ධියක් ඇති කෙනෙක්. එතුමා රජීව් ගාන්ධි අගමැතිතුමත් සමඟ යම් ගිවිසුමක් අත්සන් කළා. එනකොට මේ ගිවිසුම ක්‍රියාත්මක වෙන්න නම් මං කලින් කිව්ව වගේම මේ ගිවිසුමට අනුකූල ව්‍යවස්ථාවන් ඉදිරිපත් කරන්න ඕනෙ පාර්ලිමේන්තුවට. එහෙම ඉදිරිපත් උනාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි මුළු රටේ ඕනෑම කෙනෙකුට මේ ව්‍යවස්ථාව වග විභාග කරල තමන්ගේ සිතැඟි ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබෙනව. ජනතාවට හඟවල කරන්න කිසි දෙයක් නෑ. පුළුවන්කමකුත් නෑ. ඕනෑම කෙනෙකුට සුප්‍රීම් උසාවියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න පුළුවන් මේ ඉදිරිපත් කරල තිබෙන නීති රීති නිසා අපේ ස්වෛරීත්වය බිඳ වැටෙනව, අපේ ඒකීය භාවය බිඳ වැටෙනව, අපේ භෞමික අඛණ්ඩතාවය කැඩිල වෙනම රාජ්‍ය ඇති වෙනව, මේ මේ ජනකොටස්වලට අසාධාරණයක් සිද්ධ වෙනව, මේ මඟින් අපේ සර්වජන ඡන්ද බලයෙ අයිතියට හානියක් වෙනව. ඔය ආදි වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ ඉදිරිපත් කළාම සුප්‍රීම් උසාවිය ඒක වග විභාග කරනව. සුප්‍රීම් උසාවිය අධිකරණ තීරණයක් දෙනව මේ ව්‍යවස්ථාව සාමාන්‍ය ඡන්දයෙන් සම්මත කරල ක්‍රියාත්මක කරන්න පුළුවන්. එහෙම නැත්නම් කියයි නැහැ සාමාන්‍ය ඡන්දයෙන් බැහැ මේ ව්‍යවස්ථාව මන්ත්‍රී මණ්ඩලයේ 2/3 ඡන්දයෙන් සම්මත වෙන්න ඕන. එහෙමත් නැත්නම් කියයි, මේක රට කැඩෙන ව්‍යවස්ථාවක්. මේකෙන් භෞමික අඛණ්ඩතාවය නැතිවෙනව. සර්වජන ඡන්ද බලය වෙනස් වෙනව. එපමණක් නෙවෙයි, ජනතාව සතුව තිබෙන පරමාධිපත්‍යයට හානි වෙනව. එහෙනම් මේක ක්‍රියාත්මක කරන්න නම්, පාර්ලිමේන්තුවෙ

2/3 ක ඡන්දයෙන් සම්මත වෙන්න ඕනෙ. ඊට පසුව මුළු රටෙම ජනමත විචාරණයකට ඉදිරිපත් කරන්න ඕනෑ ය කියල, සුප්‍රීම් උසාවිය කියයි. එහෙම ක්‍රියා නොකලොත් ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් කමක් නෑ. එහෙනම් මොකටද අපි කලබල වෙන්නෙ ?

දැන් මං ආපු දවසෙ ඉඳලම නොයෙක් අය මගෙන් අහනව තමුන්නාන්සේගේ අදහස මොකක් ද ? කියල. ඉතින් මං කල්පනා කලා මං වගෙ පොඩි මිනිහෙක් ගෙන් මෙ තරං විශාල පිරිසක් ඇයි මේ ප්‍රශ්නෙ අහන්නෙ ? මං මේ දවස්වල හිත හිතා හිටියෙ ඕක ගැන. බොහෝම දැන උගත්කම් ඇති අය, කාලාන්තරයක් තිස්සේ මා නපුරු නරක මිනිහෙක් යැයි කියල කියපු අය පවා දැන් කියනව ප්‍රේමදාස මොකක් ද මෙකට කියන්නෙ ? අගමැති මොනව ද කියන්නෙ ? ඇයි එහෙම අහන්නෙ ? මං දන්නවා මගේ මේ අවුරුදු 30ක අවුරුදු 35ක පොදු ජන සේවා කාලයෙන් මා ගොඩනගා ගත්ත සම්පත තම ජනතාවගෙ විශ්වාසය දිනාගැනීම ය කියන එක. මේ මනුස්සය කියන දේ අපි නොපිළිගත්තත් මෙයා කවදාවත් බොරුවක් නොකියන කෙනෙක් ය කියන එක ජනතාව පිළිඅරන් තියෙනව. ඉතිං මං කැමතියි ඒක ආරක්ෂා කර ගන්න. දැන් මේ දිනවල අපි කරන්නෙ මේ ගිවිසුමෙ හැම අංශයක්ම අපි සොයා බලනව. නිරීක්ෂණයට පත් කරනව. මේ ගිවිසුම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ ද නැද්ද කියල සොයල බලනව. අපට ඒ සඳහා අවකාශ තිබෙනව. හැම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම මේ අවකාශය තිබෙනව. විධායක ජනාධිපතිවරයෙකුට ගිවිසුමක් ඇති කරගන්නට පුළුවන්කම තිබෙනව. ඒ වගේම ඒ ගිවිසුම පරීක්ෂා කරන්න, ඒ ගිවිසුම නීතිගත වෙන්න පෙර හැම රටවැසියෙකුටම එහි තොරතුරු සොයා බලන්න, තමන්ගෙ අදහස් ඉදිරිපත් කරන්න, අවකාශය තිබෙනව. මොන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙද ඒ අවකාශය තිබෙන්නෙ. ? ඉස්සර මන්ත්‍රීවරුන්ට විතරයි මේ අවකාශය තිබුණෙ. මං ඒකයි කිව්වෙ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉතා විශිෂ්ට ව්‍යවස්ථාවක්. මන්ත්‍රීවරයෙක් නොවුවත් රටේ හැම කෙනෙකුටම තමන්ගේ රටට බලපාන, තමන්ගේ අනාගතයට බලපාන, ව්‍යවස්ථාවක් තිබෙනව නම් ඒ ගැන සොයා බලන්න, කරුණු ඉදිරිපත් කරන්න, වැරදි

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

නැත් පෙන්වා දෙන්න. සුප්‍රීම් උසාවියටම පෙන්වා දෙන්න අවකාශයක් ඇති විශිෂ්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බව අපට අද තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා තමයි මේ රටේ උරුමය භාරගන්න ඉන්න දූවා දරුවන්ට විශාල ලැදියාවක්. සෙනෙහසක් ඇති පිරිසක් ලෙස අපි කැමතියි මේ රට අඛණ්ඩව පවත්වාගෙන යන්න. මේ රට බෙදී තිබුණ නොයෙක් කාලවල කොටස්වලට කැඩී තිබුණ. නමුත් පසුව අපේ මුතුන්මිත්තෝ මේ රට ඒකීය රටක් බවට පත් කළා. අපේ අයිතිය, අපේ උරුමය දිගටම පවත්වාගෙන යන්න ඕන.

අපි බලන්න ඕන අපේ ජනාධිපතිතුමාත් ඉන්දියාවෙ අගමැතිතුමාත් අතර ඇතිවෙච්ච ගිවිසුමෙන් අපේ රට කැඩීම නතර උනාද ? එහෙම නැත්නම් අපේ රට කැඩෙනව ද ? කියල. ඒක විභාග කරන්න පුළුවන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට තිබෙන්නෙ. එහෙම තියෙද්දී විරෝධයක් තිබෙනව නම්, මතභේදයක් තියෙනව නම් ඒව එළිකරන්න අවකාශයක තිබෙන විට අපි නොදැමුණු ක්‍රියාවන්වල යෙදුනොත් ඒකෙන් අසාධාරණය කාට ද, ඒකෙන් විපත කාට ද කියල අපි ටිකක් කල්පනා කරන්න ඕන. දැන් බලන්න දැනටමත් වෙලා තිබෙන මිනිස් ඝාතනය දැනටමත් වෙලා තිබෙන පොදු හා පෞද්ගලික දේපල විනාශය. සුළුපටු නොවෙයි. ඒ නිසා අපේ යුතුකමක් තිබෙනව මේ ගැන කල්පනා කරන්න. මෙවැනි දේවලට අපි ඉඩ තියන්න නරකයි. ඒ වගේම මං කියන්න කැමතියි යම් යම් අය අතර නොයෙක් අසහන තිබෙන්න පුළුවන්. ඒවා අපට සහනයකට පත්කර ගන්න පුළුවන්. අද උතුරෙන් නැගෙනහිරන් ත්‍රස්තවාදීන් අවි බිම තියාගෙන යනව නම්, එහෙම අවි බිම තියන, හිංසාව අත් හරින අයට සමාවක් දෙනව නම්, ඒ විදියට අනිත් ප්‍රදේශවලත් අවි ආයුධ අත් හරිනව නම්, හිංසාව අත් හරින හැමදෙනාටම එවැනිම සමාවක් දීමට අපේ රජය සූදානම් බව මම ප්‍රකාශ කරන්න කැමතියි. එක නීතියක් එක පිරිසකට පමණක් නෙවෙයි. එක පළාතකට පමණක් නෙවෙයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතෙ කාටත් පොදු වෙන්න ඕනෙ. ඒ හැමදෙනාටම පොදුවෙ සමානාත්මතාවයෙන් ක්‍රියා කරන්නට බැඳී සිටින රජයක් අපේ රජය.

මේ රටට ආදරයක් තිබෙන, මේ සමාජයට ආදරයක් තිබෙන, අනාගත පරම්පරාවට ආදරයක් තිබෙන යම් පිරිසක් සිටිනව නම් තමුන්නාන්සේලාගේ කුමන අසහනයක් තිබුණත් ඒවා සහනයකට පත් කර ගන්නට ක්‍රම තිබෙනව. සාකච්ඡාවෙන් ; සම්මන්ත්‍රණයෙන් ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ඒව සහනයකට, සමනයකට පත් කර ගන්න ඔනෑ තරම් අවකාශ තිබෙනව. අපි දන්නව වෙගයක්, ද්වේෂයක් ඇති උනහම සමහරවිට මනුෂ්‍යත්වය අමතක වෙනව. තමන් තුළ තිබෙන ශක්තිය අමතක වෙලා බාහිර අවි ආයුධවල ශක්තිය හොයාගෙන යනව. මගේ හිතේ ඒක මනුෂ්‍ය දුර්වලකමක්. මම විශේෂ ආයාචනයක් කරනව අපේ රට පුරාම සිටින හැමදෙනාගෙන්ම හිංසාවකින් කවදාවත් අපටවත් අනුන්ටවත් කිසිම විමුක්තියක්, සහනයක් ලබා ගන්න බැහැ කියල. නොයෙක් අය උසිගන්වයි. "ගැහුවොත් තමයි මිනිහො ලැබෙන්නෙ, මැරුවොත් තමයි මිනිහො ලැබෙන්නෙ, කඩා බිඳ දැම්මොත් තමයි ලැබෙන්නෙ " කියල කියයි. එහෙම කියන අය අන්තිම මොහොතේදී තමන්ව අතරමං කරයි. අර ප්‍රභාකරන් කියන දේ බලන්න. ප්‍රභාකරන් විශාල රැස්වීමක් තියල මොනවද කිව්වෙ. අනේ අපි දන් අනාථ උනා. ඒක එහෙම තමයි. අනුන්ගෙ කිවුම් බස් අනුව වැඩ කරන්න ගියොත් අර මනුස්සය වෙනස් වෙච්ච හැටියෙ, තමන්ව අතරමං වෙනව. ප්‍රභාකරන්ගෙ ප්‍රකාශයෙන් හුඟක් උපදෙස් අපට ලබාගන්න පුළුවන්.

ඒ නිසා නොයෙක් නොයෙක් බලවේග උසි ගන්වයි ගහපන්, මරපන්, කොටපන්, කඩපන් කියල. අන්තිමේදී උපදෙස් දෙන අයම දැන් ඔනෙ නෑ බං කියලත් කියයි. එතකොට මේ හිංසාවට යොමු වෙච්ච අය අනාථ වෙනව. ඒක තමයි නිරන්තරයෙන්ම මගේ විශ්වාසය තිබෙන්නෙ බලගතු ස්වල්ප දෙනා කෙරෙහි නොවෙයි දුබල අති විශාල ජනතාව කෙරෙහි විශ්වාසය හැමදාම තිබෙන්න ඔන කියල. ඔය බලවත් උදවිය වෙලාවට වැඩේ කරගෙන වෙන වාසියක් ලැබිච්ච හැටිය කියනව අත් ඇරල දාපන් කියල. ඉතින් අපි අනාථ වෙනව. දුප්පත් අහිංසක පොදු ජනතාව කවදාවත් අපව අනාථ නොකරන බව මට ඒකාන්තයෙන්ම විශ්වාසයි. ඒ නිසා තමයි මම යමක් කියනව නම්, කරනව නම්, හොඳට හිතල බලල

එය පොදු ජන ශුභසිද්ධියට හේතු වෙනවද කියල බලන්නෙ. මං පුරුදුවෙලා තිබෙන සමාජ සේවය, පොදුජන සේවය ඒකයි. මං යම් පියවරක් තම තියම කරගන්නොත් ඒ තම තියම කර ගැනීමේදී මං නිරන්තරයෙන්ම කල්පනා කරන්නෙ මේක ස්වල්ප දෙනෙක්ගෙ බලතල තහවුරු කරන වැඩපිළිවෙළක් ද කියන එක නොවෙයි ; මේක නැති බැරි ජනතාවට සුභසිද්ධියක් ගෙන දෙන එකක් ද කියල. මම මැනල කිරල බලල යමක් කියන්නෙත් කරන්නෙත් ඒ නිසයි. මම හිතන විදියට ඒ නිසා වෙන්න ඕනෑ දන් කවුරුත් මගෙන් අහන්නෙ මේ වෙලාවෙ මම මොනවද කියන්නෙ කියල. මං කියන්නම් හොඳට හොයල බලල තොරතුරු දැන කියාගෙන. අපි දේශපාලන පක්ෂයක වැඩ කරන පිරිසක්. අපි ආණ්ඩුවක වැඩ කරන පිරිසක්. අපිත් අනුගමනය කළ යුතු වයවස්ථාධර්ම පද්ධතියක් තියෙනව. ප්‍රථමයෙන්ම අපි අපේ කැබිනට් මණ්ඩලය සාකච්ඡා කරල, ආණ්ඩු පක්ෂෙ සාකච්ඡා කරල, එහෙම කරල තමයි අපි පාර්ලිමේන්තුවේදි කරුණු හෙළි කරන්නෙ. ඒ විදියටයි අපි වැඩ කරන්නෙ. විනයක් කියල එකක් තිබෙන්න ඕන. සමාජයක යහපත් පැවැත්මට විනය ඉතාමත්ම අවශ්‍යයි. අපේ තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදු පියාණන්වහන්සෙ විනය පද්ධතියක් ඉදිරිපත් කළේ නීති රීති ඇති කර ගැනීමට ඇති ආශාවක් නිසා නොවෙයි ; ධර්මානුකූල හැඩ ගැස්මක් ඇති කර ගැනීමට යම් විනයක් අවශ්‍ය නිසයි. අපි විනයානුකූලව ක්‍රියා කරන්න ඕන. පාර්ලිමේන්තුවෙ හිටියත් පිටත හිටියත් අපේ පොදු ජනතාවට මෙ විදියට ක්‍රියා කරන්න පුරුද්දක්, පුහුණුවක් ඇති වෙන්න ඕන.

මෙ ළදරු අධ්‍යාපන ක්‍රමයෙන් මෙ විදියේ ශික්ෂණයක් ඇති වන අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය යි. ඒක විශේෂයෙන්ම අපේ ආගමික සිද්ධස්ථානවලින් ආරම්භ වෙන්න ඕනෑය කියල මම හැමතැනම කියන්නේ ඒ නිසයි. අපේ ගරුතර මහා සංඝරත්නයට මම ආරාධනය කරන්නෙ, අනිකුත් ආගමික පූජකයන්වහන්සේලාට මම ආරාධනය කරන්නෙ ඒ නියයි. කුඩා කාලෙ ඉඳලම මේ ශික්ෂණය ඇති වීම සමාජයේ ඉතාමත්ම අවශ්‍ය දෙයක්. ඒ නිසා මං මෙ අවස්ථාවෙ විශේෂ ඉල්ලීමක් කරන්න කැමතියි යම් යම් උදවිය තමන්ගේ තිබෙන මානුෂික ශක්තියෙන්

බැහැරව, තමන්ගේ තිබෙන මානසික තත්ත්වයෙන් බැහැරව, චෛතසික ශක්තියෙන් බැහැරව, අවි ආයුධ මගින් තමන්ගේ සිත්සතන් විවෘත කරන්න අදහස් ප්‍රකාශ කරන්න කල්පනා කිරීම අපේ මනුෂ්‍යත්වයට ගැලපෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා අවි පහත දමා, සාමකාමීව අපට අපේ අදහස් උදහස් ප්‍රකාශ කරන්න තිබෙන අවකාශවලින් ප්‍රයෝජනය ගැනීම ඉතාමත්ම සුදුසු බව මම ප්‍රකාශ කරන්න කැමතියි. ඒ අයිතිය අප හැමදෙනාටම තිබෙනවා. අපේ රටට සාමය අවශ්‍යව තිබෙනවා. සාමය නැතුව කවදාවත් අපේ රටේ සමෘද්ධියක් ඇති කරන්න බැහැ. සාමයත් සමෘද්ධියත් අපි ඇති කර ගනිමින් අපේ රටේ ඒකීය භාවය, අපේ ස්වෛරීත්වය අපි ආරක්ෂා කර ගනිමු. අපි ත්‍රස්තවාදය හෙළා දකින පිරිසක්. ත්‍රස්තවාදය පිළිකුලට භාජනය කළා. අපි පිළිගන්න ඕන එක ත්‍රස්තවාදයක් නැති කරන්න තව ත්‍රස්තවාදයකට බැරි බව. ඒ වගේම අපි නිතරම මතක තියාගන්න ඕන අප, අප, අතර ඇණ කොටා ගැනීම්, වාදභේද ඇති වුණොත් අහක ඉන්න උදවිය ඇවිත් අපි සියලු දෙනාම බෙදාහදාගන්න බලාපොරොත්තු වන දේවල් ඩැහැගෙන යන්න පුළුවන්. මම නිරන්තරයෙන්ම කියපු කතන්දරයක් මං මතක් කරන්නම්. පාර්ලිමේන්තුවේදීත් පිටතත්. පුංචි කාලෙ අපි ඉස්කෝලෙ යනකොට අතිරේක කියවීම් පොතේ තිබ්බිච කතන්දරයක්.

මොකක්ද ඒ කතන්දරය :

එක ගොදුරකට සිංහයයි කොටියයි ඇණ කොටා ගත්තා. දෙන්නම ඇණ කොටාගෙන දෙන්නම පහුරුගාගෙන මේ තරගයෙන් මහන්සි වෙලා දෙන්නම මහන්සි වෙලා දෙපැත්තට වැටිල හිටිය. දෙන්නටම ගොදුර ලැබුණෙ නැ. කාට ද ලැබුණෙ. අහක හැංගිල ඉඳල මේක බලාගෙන ඉදපු නරිය ඇවිල්ලා ගොදුර ඩැහැගෙන ගියා. මේවා අපට පුංචි කාලෙ ඉගැන්නුවෙ මේවායෙ අර්ථයක් තිබෙන නිසයි. අන්න එහෙම කල්පනා කරගෙන අපි කවුරුත් සමගියෙන්, සාමයෙන් අපේ ප්‍රශ්න නිරාකරණය කර ගන්නට ක්‍රියා කරන මෙන් ඉල්ලමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව